# ශ්‍රී ලංකාවේ පාරම්පරික මැණික් කැටයම් ශිල්පීන් රැක ගනිමු

ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස්
අධ්‍යක්ෂ ජනරාල්,
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

ඉතා ඈත අතීතයේ සිටම ඉන්දියන් සාගරයේ මුතු ඇටය හා රත්න ද්වීපය ලෙස විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව මැණික් හා ගල් කැටයම් නිර්මාණ කලාව සම්බන්ධව ඉතා ඉහළ ප්‍රසිද්ධියක් අත්කර ගෙන තිබුණි. ඔවුන්ගේ මෝස්තර ශිල්පය එක් එක් නිර්මාණය අනුව වෙනස් විය. වරෙක සියළු සමාධි ගුණ කැටි කොට බුදු රුවක් නෙළන ශිල්පියාම තවත් වරෙක ආලය ලීලය පිරිපුන් පෙමින් බැදී යුවලක් කිසිදු හැඩයකින් තොර පැතලි ගලක් ඇසුරෙන් නිර්මාණය කරන්නට යෙදුනි. මේ පණිවුඩය රැගත් චිත්‍රා සෝමපාල මහත්මියගේ ගීතයක් කලකට ඉහතදී නිතර අප සවන් වැකුනි. එනම් "ඉසුරුමුණියේ.. හී පැතලි ගලක ඒ ආලය ලීලය පෑ.. විශ්මිත ගල් වඩුවාණනි ඔබ හට අප ණය ගැති නොවෙදෝ.." ඒකළ අපගේ සියළුම කලා ශිල්පීනට රාජ්‍ය අනුග්‍රහය නොමදව ලැබුණි. ශිල්පීන්ද තමන් අවට ඇති සම්පත් උපයෝගී කරගෙන කර්මාන්තයේ නියැලීමට ද ඒ ඇසුරින් ජීව ගුණය පිරි නිර්මාණ එළි දැක්වීමටද සහජ දස්කමක් දැක්වීය. ඔවුන් ඉතා ඉහළ නිර්මාණ එළි දක්වන සැම විටම එකල රජ කළ රජවරුන් වෙතින් පදවි පාක්කුඩම් හා සම්මාන හිමි විය. මේ අතරින් සමහරකුට නින්දගම් පවා හිමි විය.



ඉසුරුමුණියේ පෙම් යුවල, ලොව පරසිදු හෙළ ගල් කැටයම


මීට අමතරව මැණික් ගල් ආශ්‍රිත කැටයම් කළ පබළු, පදක්කම් හා මුද්‍රා දිවයිනේ නොයෙකුත් පළාත් වලින් හමු වේ. මේ අතරින් බොහොමයක් ඉපැරණි සොහොන් බිම් අශ්‍රිතව ලැබෙන අතර නවතම ගණන් බැලීම් අනුව සමහරක අතීතය ක්‍රි.පූ.1000 දක්වා දිව යන අවස්ථා ඇත (උදා. ඉබ්බන්කටුව සුසාන භූමිය)

එසේම ඉතා විශාල පබළු තොගයක් අනුරාධපුර නගරය ආශ්‍රිත පුරාවිද්‍යා කැණීම් වලින් මතු කරගෙන ඇති අතර, මුක්කරු ගල් සෑහෙන ප්‍රමාණයක් වලන් කටු ඉල්ලම (පල්ලෙබැද්ද) හා අනෙකුත් මුක්කරුන් ජීවත් වූ ප්‍රදේශ ආශ්‍රිතව යහමින් හමු වේ. (එකල ජීවත් වූ මැණික් ආශ්‍රිත කැටයම් ශිල්පීන් මුක්කරුන් ලෙස හඳුන්වනු ලැබීය)




පුරා විද්‍යාත්මක කැනීම් තුළින් මතු කර ගත් විවිධ වර්ගයේ පබළු

මෙම මුක්කරු ගල් අතර විවිධ වර්ගයේ මැණික් වලින් නිර්මිත පබළු හමුවන අතර ඒ අතරින් කුරුවින්ද, රබහ, අමතෙස්ත, අගස්ති හා ජාගුන් සුලබව දැකිය හැකි වන අතර පුදුම උපදවන කාරණය වනුයේ ඔවුන් කුරුවින්ද වැනි ඉතා ඉහළ දැඩියාවක් ඇති මැණික් ගල් වර්ග කෙසේ සිදුරු කලාද යන්නය. තාක්ෂණයෙන් සපිරි වර්තමානයේත් මෙම කාර්යය සළකනුයේ ඉතා අපහසු කාලය වැයවන කාර්යයක් ලෙසය. එහෙත් ඔවුන් මෙම කාර්යයේ හසල නිපුනත්වයක් දැක්වූ බවට ඔවුන්ගේ නිර්මාණ සාක්ෂි දරයි. ඔවුන් මෙම සියලු පබළු කැට දෙපසින් සිදුරු කර ඇත. විශාලක කාචයක් භාවිත කළ විට ඒ බව ඉතා පහසුවෙන් දැක ගත හැක.



දෙපසින් සිදුරු කොට ඇති ලංකාවේ හමුවන පබළු

මේ අතරම අනෙකුත් පුදුම දනවන මැණික් ආශ්‍රිත වස්තූන් වනුයේ අපගේ පුරාවිද්‍යා කැනීම් තුලින් මතු කර ගෙන ඇති පදක්කම් හා මුද්‍රාශ සමූහයයි. මෙම විසිතුරු කුඩා වස්තූන් විවිධ වර්ගයේ මැණික් එනම් කුරුවින්ද, රබහ, අමතෙස්ත, අගස්ති හා කනක වර්ග වලින් යුක්ත වන අතර ඉතා සියුම්ව කැටයම් කර ඇත. කෙතරම් සියුම්ව කැටයම් කර ඇත්ද යත් සමහර නලඟනන් ඇඳ සිටින දුහුල් සළු පිළි පවා මෙම කුඩා නිර්මාණ තුල හඳුනා ගත හැක.




පුරාවිද්‍යා කැනීම් තුලින් මතු කර ගත් මැණික් ආශ්‍රයෙන් කැටයම් කල පදක්කම් සහ මුද්‍රාශ

පසුගිය දශක කිහිපය තුළ මෙම කලාව වැලලී යන ස්වභාවයක් දක්නට ලැබුන අතර ඊට ප්‍රධාන හේතුව වූයේ ඒ හා සම්බන්ධ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයයි. මේ බව මනාව අවබෝධ කර ගත් මැණික් හා ස්වාර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය මෙම ඉපැරණි කර්මාන්තය රැක ගැනීමේ අරමුණින් කටයුතු දියත් කරන්නට යෙදුනි. ඒ අනුව මේ ක්ෂේත්‍රයේ දැනට ඉතිරිව ඇති කිහිප දෙනා අතුරින් වඩාත්ම සුදුසුකම් ඇති තැනැත්තා තෝරා ගෙන ඔහුගේ උපදේශකත්වය යටතේ මේ හා සම්බන්ධව නව පාඨමාලාවක් ඇරඹීමට කටයුතු සම්පාදනය කිරීමයි. මෙය ඇත්තෙන්ම ආයතනය ලැබූ ජයග්‍රහණයක් වන අතරම මතු දිනෙක මෙම කර්මාන්තය සම්බන්ධ පුහුණුව ලබන සිසුන්ගේ ද වාසනාවකි. මීට හේතුව නම් ඔහු වචනයේ පරිසමාප්තියෙන්ම අති දක්ෂ උපදේශකයකු වීමය. ඔහුගේ දර්ශනය වනුයේ මෙය අතිශයින්ම කලාත්මක විෂයක් හා ඉතා සංයමයෙන් කල යුතු කාර්යක් බැවින් කලාවට ලැදි සිසුන් වරකට කිහිප දෙනෙකු බැගින් බඳවා ගෙන පුහුණු කිරීම කාලෝචිත බවයි.

ඇත්තෙන්ම ජයන්ත ඉලන්ගකෝන් මහතා යනු මැණික් ක්ෂේත්‍රයට කෝඩුකාරයකු නොවේ. ඔහු මුළු ක්ෂේත්‍රයම දන්නා හඳුනන ඉතා දක්ෂ මැණික් කැටයම් ශිල්පියෙකි. දැනට ලංකාවේ විශාල දාගැබ් රැසකම දක්නට ලැබෙන චූඩා මාණික්‍ය රැසක්ම හැඩ ගැන්වී ඇත්තේ ඔහුගේ දෑතින් වන අතර කවුරුත් නොදන්නා ලංකාවේ පන්සල් ගණනාවකම ඇති ධාතු මංජුසා ගනනාවක්ම නිර්මාණය කර ඇත්තේද ඔහුමය. පහතින් දැක්වෙන පරිදි ධාතු මංජුසාවක් ඔහු දෑතින් නිර්මාණය වන රූප පෙළ ඔහුගේ දස්කම් මොනවට පැහැදිලි කරයි.



මැණික් කැටයම් සදහා භාවිත කරන ගල් කැබැල්ලක්



මූලික හැඩතල සකසා ගැනීම



ඔප දැමීමට ප්‍රථම නෙලුම් මලක් හැඩැති මංජුසාව



ඔප දමමින් පවතින නෙලුම් මලක් හැඩැති මංජුසාව



ඔප දැමූ පසු නෙලුම් මලක් හැඩැති ධාතු මංජුසාව

මෙම නිර්මාණ තුළින් වචන දහසකින් කිව නොහැකි කතාවක් එක් දර්ශන පෙළකින් කිව හැකි බව මෙහිදී මනාව පැහැදිලි වේ.

මේ සියල්ලට අමතරව මෙම කර්මාන්තය ඉතා ලාබ දායක ගෘහ කර්මාන්තයක් බවද සඳහන් කිරීමට කැමැත්තෙමි. මේ ඇසුරින් අපගේ සංචාරක කර්මාන්තයට නව ජීවයක් ලබා දීය හැකි වන අතර රටට අවශ්‍ය විදේශ විනිමය ඉතා පහසුවෙන් ලඟා කර ගත හැක. ඒ අතරම මැණික් කර්මාන්තයේදී කවුරුත් නොසලකා හරින පලිඟු, කහද, සරපන්ටීන්, ඇපටයිට්, හුණුගල් හා සෙව්වන්දි වලට ඉතා ඉහළ අගය එකතු කිරීමක් කළ හැක. දැඩිව පවතින රැකියා ප්‍රශ්නයටත් මෙය හොඳ පිළිතුරකි. මන්ද යත් මේ පාඨමාලාව තුළින් ආයතනය බලාපොරොත්තු වන්නේ හුදෙක් මැණික් කැටයම් ශිල්පියකු බිහි කිරීම පමණක් නොව මේ කර්මාන්තය තුළ තමාගේම දෙපයින් නැගී සිටිය හැකි ව්‍යවසායකයකු බිහි කිරීමයි. අවාසනාවකට අද වනවිට මෙම කර්මාන්තය බිඳ වැටෙමින් පවතින දේශීය කර්මාන්ත අතරට එකතු වන්නට බොහෝ ආසන්නව ඇති අතර එය රැක ගැනීම රජයේ පමණක් නොව ලාංකිකයන් වන ඔබ අප සැමගේ වගකීමයි.

මේ වගකීම මනාව වටහා ගෙන කටයුතු කරන මැණික් හා සම්බන්ධ පුහුණු හා පර්යේෂණ අංශයන්හි නියැලී සිටින රජයේ එකම ආයතනය වන මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය මෙහිදී වඩාත් ඉදිරියට පැමිණ ඇත. මැණික් කර්මාන්තයේ හදවත බඳු රත්නපුර නගරයේ පවතින මෙම ආයතනයේ ශාඛා කාර්යාලයේ දැනටමත් මෙම පාඨමාලාව පවත්වා ගෙන යන අතර මේ වන විටත් සැලකිය යුතු පිරිසකගේ අවධානය හා ප්‍රසංශාව දිනා ගැනීමට සමත් වී ඇත.

මෙහිදී මෙම ආයතනය සියලුම මැණික් කර්මාන්තයට පිවිසෙන්නට අපේක්ෂාවෙන් සිටින සිසුන් ගෙන් ආයාචනය කරනුයේ ආයතනය පිළිබද මෙතෙක් තැබූ විශ්වාසය එලෙසින්ම ඉදිරියේදීත් තබා ගන්නා ලෙසයි.

